2024
ජූලි

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA


## 2024 ජූලි මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන හා සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ වර්ධනයක් පිළිබිඹු කරමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2024 ජූලි මාසයේ දී දර්ශකාංක 59.5ක් වාර්තා කළේය.** මෙම වර්ධනය සඳහා සියලුම උප දර්ශකයන්ගේ ඉහළ යෑම දායක විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**59.5**

**2024 ජූලි**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් උප දර්ශකය ඉහළ යෑම සඳහා රෙදිපිළි හා ඇඟලුම් අංශය ප්‍රධාන වශයෙන් දායක විය. තවද, මූලික වශයෙන් ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයන්හි ඉහළ ක්‍රියාකාරීත්වය හේතුවෙන් මෙම මාසය තුළ දී නිෂ්පාදන උප දර්ශකය ඉහළ ගියේය. සේවා නියුක්තිය ද ජූලි මාසයේදී ඉහළ ගිය අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් අංශයේ දායකත්වය ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා ඉල්ලුම ඉහළ යෑමත් සමග තොග මිලදී ගැනුම් ඉහළ ගියේය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ජූලි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචලයය | ජූනි | ජූලි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.6** | **59.5** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 57.1 | 62.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 58.2 | 61.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 48.5 | 54.0 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 56.1 | 60.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 63.9 | 57.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉල්ලුම තවදුරටත් වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ඉහළ මට්ටමක පවතියි.

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් ජනපදය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | සමාන වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 අගෝස්තු 14 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, එනම් ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, 2024 ජූලි මාසයේ දී, මෙම වසර තුළ මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වන දර්ශකාංක 71.1ක් වාර්තා කරමින් සේවා ක්‍රියාකාරකම්වල තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ යෑම සඳහා බොහෝ අංශයන්හි සිදු වූ වර්ධනයන් හේතු විය. ප්‍රධාන වශයෙන්, භාණ්ඩ ප්‍රවාහන හා ගුවන් සේවා අංශවල ඇති වූ වර්ධනයන් හේතුවෙන් ප්‍රවාහන සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ ගියේය. තවද, තොග සහ සිල්ලර වෙළෙඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද ජූලි මාසයේ දී සැලකිය යුතු වර්ධනයන් වාර්තා කරන ලදී. එසේම, පසුගිය මාසවල දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවාවන්ට අදාල ව්‍යාපාර ක්‍රියාකාරකම් මෙම මාසයේ දී සංචාරක පැමිණීම් ඉහළ යෑම හේතුවෙන් වර්ධනය විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ ප්‍රවාහන සේවා කටයුතුවල සිදු වූ වර්ධනයන් සමග, ජූලි මාසයේ දී නව ව්‍යාපාරවල වැඩිවීමක් දක්නට ලැබුණි.

සමාගම් කිහිපයක් විසින් සුළු වශයෙන් නව බඳවා ගැනීම් සිදු කළ ද, සේවා නියුක්තිය ජූලි මාසයේ දී පහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන් මෙම මාසයේ දී අඛණ්ඩව පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** (**ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය**) | 63.5 | 71.1 | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 60.5 | 66.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 56.6 | 49.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.4 | 48.4 | = | සමාන වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 73.2 | 74.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


පවත්නා හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ට සමගාමීව ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, ජූලි මාසයේ දී වැඩි වේගයකින් අඛණ්ඩව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**71.1**

**2024 ජූලි**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 අගෝස්තු 14 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භාරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාතර්මේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කමර්ාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.